# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය

SINHALA

ECHO OF HIS CALL 1969-2019 GOLDEN JUBILEE

REACHING NATIONS

India's National Spiritual Newspaper

₹ 10/-

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

Editor : S. SAM SELVA RAJ

16 Languages

Vol. XVII | AUGUST 2023 | Issue No. 09


## ශුද්ධවූ බයිබලය

**(ගීතාවලිය 103:8-17)**

08. ස්වාමීන්වහන්සේ අනුකම්පාවෙන් හා දයාවෙන් පිරී සිටිනසේක, කෝප වීමට ප්‍රමාදය. අතිශයෙන් කරුණාවන්තය.

09. උන්වහන්සේ නිතර තරවටු නොකරනසේක; සදාකාලයට කෝපය නොපවත්වන සේක,

10. උන්වහන්සේ අපේ පාපවල ප්‍රකාරයට අප කෙරෙහි ක්‍රියා නොකළසේක, අපේ අයුතුකම්වල ප්‍රකාරයට විපාක නුදුන්සේක.

11. මක්නිසාද පොළොවට උඩින් අහස උස්ව තිබෙන්නාක්මෙන් උන්වහන්සේ කෙරෙහි භය ඇත්තන්ට උන්වහන්සේගේ කරුණාව මහත්ය.

12. නැගෙනහිර බස්නාහිරෙන් දුරව තිබෙන්නාක්මෙන් උන්වහන්සේ අපේ වරද අපෙන් දුරුකළසේක.

13. පියෙක් තම දරුවන්ට අනුකම්පා කරන්නාක්මෙන් ස්වාමීන්වහන්සේ තමන් කෙරෙහි භය ඇත්තන්ට අනුකම්පා කරනසේක.

14. මක්නිසාද උන්වහන්සේ අපේ ස්වභාවය දන්නාසේක; අප ධූලි බව උන්වහන්සේ සිහිකරනසේක.

15. මනුෂ්‍යයාගේ දවස් වනාහි තණකොළ මෙන්ය; ඔහු කෙතේ මලක් මෙන් සශ්‍රීකවේ.

16. මක්නිසාද හුළඟ වැදී එය නැතිවී යයි; එය තිබුණු ස්ථානයද තවත් එය දැනනොගන්නේය.

17. නුමුත් ස්වාමීන්වහන්සේගේ කරුණාව තමන්ට භය ඇත්තන් කෙරෙහි සදාකාලයෙන් සදාකාලයටද, උන්වහන්සේගේ ධර්මිෂ්ඨකම දරුවන්ගේ දරුවන්ටද පවත්නේ.

# ආකෝර් මිටියාවත බලාපොරොත්තුවේ දොරටුවයි.

## THE VALLEY OF ACHOR: A DOOR OF HOPE!

(පාස්ටර් ඇන්ජලීන් සෙල්වකුමාරි)



ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් ඔබ සැමට ආසිරි පතමි. 2023 වන වසරේ ගෙවී ගියාවූ මස 7 පුරාවටම දෙවියන්වහන්සේ උන්වහන්සේගේ කරුණාව අප හා සමඟ තබමින් අපව මෙතරම් දුරක් ගෙන ආ නිසා අපි ස්වාමින්වහන්සේට ස්තුති කරමු. සමහර අයට මෙය අද දක්වාම බලවත් වූ ආශිර්වාදයක් වූ අතර තවත් අයට එය ආශිර්වාදයක් නොවීය. තවත් අයට මේ වර්ෂය මේ දක්වාම ඉතාම නපුරු වූ වසරකි. නමුත් තවත් අයට මෙය බලවත්වූ ආශිර්වාදයකි. නමුත් අපගේ ජීවිතයේ සෑම අවස්ථාවකදීම අප එක් දෙයක් මතකයේ තබා ගත යුතුය. එනම්, ස්වාමීන්වහන්සේ යහපත්ය. උන්වහන්සේ කරන්නාවූ සියලුම දේ යහපත්ය. උන්වහන්සේ අපගේ ජීවිතයේ සිදුවෙන්නාවූ සියලු දේ යහපත පිණිස ක්‍රියා කරන්නාවූ දෙවියන්වහන්සේයි. අපගේ බලාපොරොත්තුව, අපගේ විශ්වාසය හා අපගේ ස්ථිරභාවය අප ස්වාමින්වහන්සේ තුල තැබිය යුතුය. උන්වහන්සේගේ වේලාවේදී සෑම දෙයක්ම ආශිර්වාදයක් බවට පත්වෙනු ඇත. මන්ද උන්වහන්සේ විශ්වාසවන්ත දෙවියන්වහන්සේ හා යහපත් වූ පියෙකි.

මා යෝෂුවාගේ පොත කියවමින් සිටියාවූ වේලාවේදී මගේ හදවතට මහත් වූ ලෙස දැනුන සිදුවීමක් නම්, ආකෝර් මිටියාවතෙහි සිදු වූ සිදුවීමකි. එය ඉතාම දුක්බර වූ සිදු වීමකි. එහිදී ආකාන් සහ ඔහුගේ මුළු පවුලම ගල් ගසා මරා දමා ගින්නෙන් පුළුස්සා දැමීය. මෙසේ ඔවුන්ව මරා දැමූ ස්ථානයට ඉශ්‍රායෙල් සෙනඟ ආකෝර් මිටියාවතය යන නම් තැබීය. **"යෝෂුවා, නුඹ අප කැළඹුවේ**

4 වෙනි පිටුවට ...




**Echo of His Call**

*Christian YouTube Channel!*

**An opportunity to pray with Pr. S. Sam Selva Raj!**

Message & Prayer in 5 minutes!!

**English, Hindi, Tamil & Telugu**

Every day – 5.00 A.M.


**Tamil Sunday Service – 8.30 A.M.**

# ECHO OF HIS CALL - (1969-2019 GOLDEN JUBILEE YEAR)

REACHING NATIONS

## *from your dearly beloved brother...*





# කැඳවීමේ ප්‍රතිරාවය

**"ස්වාමීන්වහන්සේ නුඹට ආශිර්වාදකොට නුඹ ආරක්ෂාකරනසේක්වා" (ගණන් කථාව 6:24)**

## THE NET BREAKS! THIS IS YOUR TIME!!

## OUR MISSION POLICY

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.


**CHIEF EDITOR**

Pastor Alex Samson Sam, B.Th., M.Div.

**ADMINISTRATION**

Bro. N. Prakasam, M.A., General Manager
Dr. Rabinder Boaz, M.S.
Bro. K. Puratchivendan

**EDITORIAL BOARD**

Sis. Jesy Veena Sam
Sis. Serena Bevin, M.A., M.Phil., B.Ed.
Dr. A. Richard Samuel, M.A., Ph.D.
Rev. Dr. K.R. Rajasekaran

**EDITOR, PUBLISHER & PRINTER**

Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.

Phone : (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766
Cell : (+91) 98410 71852, 95661 31858

**E.mail ID**

sam@echoofhiscall.org
biblecor@yahoo.co.in

**WEBSITES**

www.echoofhiscall.org
www.stpaulsmatriculation.com

**YOUTUBE CHANNEL**

Echo of His Call


**මෙය ඔබගේ වේලාවයි. ඔබගේ බාධාව ඉවත් වෙයි. බොහෝ ප්‍රේමාන්විත දෙවියන්වහන්සේගේ දරුවෙනි.**

**අපගේ ස්වාමී වූ ගැළවුම්කාර යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ අසමසම වූ නාමයෙන් අපි ඔබව ආදරයෙන් සුභ පතමු.**

අපගේ ආශාව නම් යේසුස්වහන්සේගේ සුභ පණිවිඩය මුලු ලෝ තලය පුරාම කුමනාකාරයෙන් හෝ ප්‍රකාශ කිරීමයි. අපගේ සීමාවටත් එහා අපගේ සේවාවන් ව්‍යාප්ත වී තිබේ.

01. කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව භාෂා 16 කින් මුද්‍රණය කර තැපැල් මාර්ගයෙන් හා අන්තර්ජාලය හරහා බොහෝ ස්ථාන වලට යවනු ලබයි.
02. දෙමළ, ඉංග්‍රීසි හා හින්දි භාෂාවන්ගෙන් තැපැල් මාර්ගික පාඩම් මාලාව පවත්වයි.
03. සභා සේවාවන් (ප්‍රධාන සභාව සහ ශාඛා සභාවන්)
04. නෙහෙමියා බයිබල් විදුහල (චේපාක්, සංතෝෂපුරම්, දෙමළ සහ වේලච්චේරි-හින්දි)
05. ශාන්ත පාවුලු මෙට්‍රිකියුලේෂන් පාසල ඉංග්‍රීසි භාෂාවෙන් පවත්වනු ලබයි.
06. කැඳවීමේ ප්‍රතිරාවය සඟරාවේ මුද්‍රණාලය.
07. කැඳවීමේ ප්‍රතිරාවයේ Youtube නාලිකාව හරහා විනාඩි 5ක දේව පණිවිඩය සැමදාම උදෑසන 5.00ට දෙමළ, තෙළිගු, හින්දි, ඉංග්‍රීසි භාෂාවන්ගෙන් විකාශනය වෙයි. ඉරුදින දේව මෙහෙයද විකාශනය කෙරෙයි.



*Some of the Graduated Students along with Pastor Sam - 2023*

මේ සියලුම සේවාවන් උන්වහන්සේගේ කරුණාව නිසා අපට දී තිබේ. ඔබගේ යාච්ඤාව ධෛර්යයමත් වචන හා උපකාරයන් නිසා අපට මේ සියලු දෙයින් ඉදිරියට යාමට හැකි වී තිබේ. මෙම සේවය අප අවංකව හා විශ්වාසවන්තව කරන විටදී යක්ෂයා උගේ උපක්‍රම පාවිච්චි කර අපව වැට්ටීමට උත්සාහ කරයි. මෙය අපට ප්‍රසිද්ධියේ කථාකළ නොහැකිය. ඒ නිසා අප උදෙසා යාච්ඤා කරන්න.

අපගේ නෙහෙමියා බයිබල් විදුහලේ සංවර්ධන කටයුතු ඉතා සීඝ්‍රයෙන් කරගෙන යයි. දෙවියන්වහන්සේ අපට මෙම බයිබල් විදුහලේ පාඩම්, දේවධර්ම පාඩම් මාලාවන් සවස් කාලයේදී පවත්වාගෙන යාමට උපකාර කර ඇත.

ජූනි මාසයේ 04 වන දින සංතෝෂපුරම් හි අපගේ නෙහෙමියා බයිබල් විදුහලෙහි උපාධි පිරිනැමීමේ උත්සවය පැවැත්විය.

එසේම නෙහෙමියා බයිබල් විදුහලෙහි සංතෝෂපුරම් පීඨයේදී තුන්වන අදියර


**Our Ministries:** ECHO OF HIS CALL Monthly Magazines (16 languages) ✿ BIBLECOR - Postal Courses (3 languages) ✿ Media Ministry ✿ Online Courses ✿ Theological Correspondence Courses (2 languages) ✿ Church Planting ✿ Nehemiah Bible Colleges ✿ Gospel Printing Press ✿ Great Commission Partners ✿ St. Paul's Matriculation School ✿ Crusades ✿ Community Development



*Nehemiah Bible College - Santhoshapuram – Special meeting*



සඳහා C.th, Dip.Th, සහ BTH ආරම්භකර ඇත. ඔබට මෙතරම් කරදර හා ප්‍රශ්ණ තිබෙන විටදී මෙලෙස අලුත් දෙයක් පටන්ගත්තේ ඇයි? කියා ඔබ සමහර විටදී ඇසීමට හැකිය. නමුත් දෙවියන්වහන්සේ අපගේ හදවත් වලට අලුත් සැලසුමක් දෙන විටදී අපට නිහඬව සිටිය නොහැකිය. අප ක්‍රියාකළ යුතුයි. සෑම දෙයක්ම සිදුවන්නේ දේව කැමැත්ත නිසාය.



අපට ඇත්තේ එකම එක ජීවිතයකි. එය ඉක්මනින්ම පහුවී යයි. එමනිසා මගේ ආශාව නම්, ස්වාමී වූ යේසුස්වහන්සේ උදෙසා අපට කළ හැකි උපරිම වූ දේ අප කළ යුතුයි. අපගේ සේවයේ පූර්ණකාලීන සේවකයින් හා ස්වේච්ඡා සේවකයින් 200කට වඩා වැඩි පිරිසක් සිටී. අපට තවත් සේවකයින් හා ඔවුන්ව නඩත්තු කිරීමට මුදල් අවශ්‍යව ඇත. එහෙත් අප මෙම බයිබල් විදුහලෙහි සේවය තවත් ව්‍යාප්ත කරමු.



දේව වචනයෙහි මෙසේ පවසයි. ***''බලව ඔහුගේ සිත උඩඟුය. එය ඔහු තුළ අවංක නැත. ධර්මිෂ්ඨයා තමාගේ විශ්වාසකමෙන් ජීවත්වන්නේය'' (හබක්කුක් 2:4) ''ඉදින් මාගේ ධර්මිශ්ඨයා ඇදහිල්ලෙන් ජීවත් වේ. නුමුත් ඔහු පසුහට වන්නේ නම්, මාගේ ආත්මය ඔහු කෙරෙහි ප්‍රසන්න නැත'' (හෙබ්‍රෙව් 10:38)***

ලූක් 5 වන පරිච්ඡේදයෙහි යේසුස්වහන්සේ නව ගෝලයින්ට, මා පෙන්වන පැත්තෙන් මසුන් අල්ලන්නය කියා පැවසූ විටදී ඔවුන් එයට කීකරු වී ක්‍රියාකළ විට, මසුන් විශාල ප්‍රමාණයක් ඇල්ලීය. ඔවුන්ගේ දැල් පවා ඉරෙන තරම් මාලු අසු වූ අතර ඔවුන්ට අන් අයගේ උදව් ලබා ගැනීමටද සිදු විය.

***''ඇවිත් තමුන්ට උපකාරයන්ට අනික් ඔරුවෙහි සිටි හවුල්කාරයන්ට ඔව්හු සංඥාකළෝය. ඔව්හු ආ කල්හි, ගිලෙන තරමට ඔරු දෙකම පුරවාගත්තෝය'' (ලූක් 5:7)***

මේ ආකාරයට දෙවියන්වහන්සේ කැඳවීමේ ප්‍රතිරාවය සේවයට හා බැඳී සියලුම සේවාවන්ට ඉතා පුදුමුකාර ලෙස ආශිර්වාද කර බොහෝ ආත්ම අපට දී තිබේ.

ඔබත් පැමිණ අපගේ සේවාවන් බලන්න අපගේ සේවයෙහි යෙදී සිටින්නාවූ අයව බලන්න. එවිට දෙවියන්වහන්සේ අපට කොපමණ අනර්ඝලෙස මග පෙන්වනවාද කියා දැකගැනීමට හැකිය.

අපට ස්ථිර ලෙස ආදායම් මාර්ගයක් නැති වුවත් දෙවියන්වහන්සේ අපට විශ්වාසවන්තව සිටී. ස්වාමීන්වහන්සේගේ සෙනග සැමදාම උන්වහන්සේව විශ්වාස කල යුතුය. උන්වහන්සේ විශ්වාසවන්තය. ***''නුඹලා කැඳවන තැනැන්වහන්සේ විශ්වාසව සිටින සේක. උන්වහන්සේ ඒක ඉෂ්ඨද කරන සේක'' (1 තෙසලෝනික 5:24)***

අපගේ දැල් බොහෝ ආත්ම නිසා ඉරී යයි. අප හා සමඟ එකතුවන්න. කැඳවීමේ ප්‍රතිරාවය සේවයට අත හිත දෙන්න. අගෝස්තු මස 10 වන දින කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ 55 වන වසර සමරයි. උන්වහන්සේගේ මහත් වූ කරුණාව අද දක්වාම මේ සේවය උදෙසා ලබා දී තිබුණි. කරුණාකර අපගේ ප්‍රශ්න අමාරුකම් ඉක්මනින්ම පහවෙන්නය කියා යාච්ඤා කරන්න.

ඔබට හැකි දේ කරන්න. දෙවියන්වහන්සේගේ කරුණාව හා ආශිර්වාදය ඔබ සමඟ වේවා...

**යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ඔබගේ සේවක**

**පාස්ටර් සැම් සෙල්වරාජ් සහ ඇලෙස්ත් සැම්සන් සැම්**

(+91) 98412 71858 / 98410 71858,
E.mail : samselvaraj333@gmail.com

....Contd. from page 1

***මක්නිසාද? ස්වාමීන්වහන්සේ අද නුඹ කළඹවන සේකැයි කීවේය. එවිට සියලු ඉශ්‍රායෙල්වරු ඔහුට ගල් ගැසුවේය. ඔව්හු ඔවුන්ට ගල්ගසා, ඔවුන් ගින්නෙන් පුළුස්සා දැමුවෝය. මහත් ගල් ගොඩක්ද ඔහු පිට ගොඩගැසූහ. එය අද දවස දක්වා තිබේ. ස්වාමීන්වහන්සේ තමන්ගේ බලවත් උදහසෙන් හැරුණුසේක, එබැවින් ඒ ස්ථානයට අද දවස දක්වා ආකෝර් මිටියාවතයයි කියනලද්දේය.'' (යෝෂුවා 7:25-26)***

ආකෝර් මිටියාවත යන්නෙහි තේරුම ''කැළඹවීම'' සහ ''වේදනාවයි''. එසේ නම් මෙම ස්ථානය බලාපොරොත්තුවේ දොරටුවක් වන්නේ කෙසේද? වේදනාව, කැළඹීම, පරාජය, ශාපය, මරණය, විනාශය සහ අධෛර්‍යකම් ඇති තැන බලාපොරොත්තුවේ ස්ථානයක් වන්නේ කෙසේද? නව ජීවිතයක්, නව ආරම්භයක් වන්නේ කෙසේද? ඔබ මෙය කියවන මොහොතේදීත්, ඔබගේ ජීවිතයත් ආකෝර් මිටියාවතක සිටිනවා හා සමානයි කියා ඔබ සිතකවා ඇති. ''සෑම දේම මලානික වී ඇත. හැමදේම නැතිවී තිබේ. මා කරනු කිසිම දෙයක් සාර්ථකව සිදුවන්නේ නැත. එබැවින් හැම දෙයම අත්හැරිය යුතුය යන සිතුවිල්ල මට තිබේ. මා දැන් වෙහෙසට පත් වී ඇත. දැන් මා හට ඉදිරියට යාමට අමාරුය.'' මෙසේ සිතන්නාවූ ඔබට සුභ පණිවිඩයක් තිබේ. බලාපොරොත්තු රහිත විනාශකාරී ස්ථානයෙහිදී බලාපොරොත්තුවේ දොරටුවක් හරිමින් ඔබගේ ජීවිතයෙහි ඔබ මුහුණ දෙන්නාවූ සියලුම දේ ඉතා අලංකාරය හා අර්ථවත්ව සිදුවෙනු ඇත. මන්ද උන්වහන්සේ දෙවියන්වහන්සේයි, උන්වහන්සේට මහත් වූ දේ ඉටු කිරීමට සියලු බලය තිබේ.

අප ආකෝර් මිටියාවත දෙස බලමු. අපි මෙය කියවන විටදී මෙම ස්ථානයෙහි පෙර සිදු වූ සටන් ගැන තේරුම්ගත යුතුය. යෝෂුවාගේ නව නායකත්වය යටතේ යෙරිකෝවට විරුද්ධව සටන් කිරීමෙන් ඉශ්‍රායෙල් සෙනඟට මහත් වූ ජයග්‍රහණයක් ලැබුණි. දෙවියන්වහන්සේගේ දිව්‍යමය බලය ක්‍රියා කරන්නාවූ ආකාරය ඔවුන් දුටුවේය. මෙසේ මනුෂ්‍යාගේ බලයට ඉහළින් දෙවියන්වහන්සේගේ බලය ක්‍රියා කරන්නාවූ ආකාරය ඔවුන් දුටුවේය. ඔවුන් මහත් වූ ජයග්‍රහණයක් අත්දුටුවේය. මිනිසුන් බොහෝ සේ ප්‍රීතියට පත්විය. අපද අපගේ ජීවිතයට දෙවියන්වහන්සේගේ ආශිර්වාදය ලැබුණු විටදී මහත් සේ ප්‍රීතියට පත්වෙන නමුත් එසේ අපට ආශිර්වාද කලාවූ දෙවියන්වහන්සේව ඉතා ඉක්මනින්ම අමතක කර දමති. සමහර විටදී අපට ලැබුණාවූ ආශිර්වාදය මලපතක් වනු ඇත. එම නිසා අපට ලැබුණු ආශිර්වාදය මලපතක් නොවන පිනිස අප වගබලා ගත යුතුය. දෙවියන්වහන්සේගේ සෙනඟ යෙරිකෝවේ ජයග්‍රහණය ලබාගත් පසුව තවත් ජාතියක් සමඟ හනම්, හායි දේශයට විරුද්ධව සටන් කිරීමට සිදුවිය. මෙය ඉතාම කුඩා දේශයකි. ඔවුන් යෙරිකෝව නැමති බලවත් රාජ්‍යයට විරුද්ධව තිබූ සටනින් ජයග්‍රහණය ලබාගත් බැවින් හායි නැමති කුඩා දේශයට විරුද්ධව සටන් කිරීම ඔවුන්ට ප්‍රශ්නයක් වූයේ නැත. ඔවුන් පෙරදී ලබාගත් ජයග්‍රහණය ඔවුන්ගේ බලයෙන් නොව දෙවියන්වහන්සේගේ බලයෙන් ජය ලබාගත් බව ඔවුන්ට අමතක විය. එම නිසා ඔවුන් හායිට විරුද්ධව සටන් කිරීමට තීරණය කලේය. නමුත් මෙම යුද්ධය ඔවුන්ට මහත් වූ ඛේදවාචකයක් විය.

***''ඒ හැටියට සෙනඟගෙන් තුන්දාහක් පමණ මනුෂ්‍යයෝ එහි ගියෝය. නමුත් ඔව්හු හායි මනුෂ්‍යයන් ඉදිරියෙන් පලා ගියෝය. හායි නුවර මනුෂ්‍යයෝ ඔවුන්ගෙන් තිස් හයදෙනෙක් පමණ මැරුවෝය. ඔව්හු නුවර දොරටුවේ සිට ෂෙබාරීම් දක්වා ඔවුන් පස්සේ එළවාගෙන් ගොස්, පල්ලමේදී ඔවුන්ට පහරදුන්නෝය. එවිට සෙනඟගේ සිත් දියවී ගොස් වතුර මෙන් වුණේය.'' (යෝෂුවා 7:4-5)***

මුළු සෙනඟගේම හදවත් භය නිසා මෙලෙක් විය. එක් මොහොතකදී යෙරිකෝවේ ජයග්‍රහණය කරණකොටගෙන ඔවුන් දෙවියන්වහන්සේගේ යහපත්කම අත්දුටුවේය. දැන් ක්ෂණිකවම කුඩා රටක් සමඟ සටන් කර පරාජයට පත් විය. එම නිසා ඔවුන් විශාල භයකින් සිටියේය. වැරදුනේ කොතැනද කියා තේරුම්ගැනීමට යෝෂුවාට අමාරුවිය. එම නිසා යෝෂුවා දේව අභිමුඛත්වයට ගොස් මුහුණින් වැටී දෙවියන්වහන්සේගේ මුහුණ සෙවීමට පටන්ගත්තේය. අප ප්‍රශ්න වලට මුහුණදෙන අවස්ථාවන් වලදී අප දේව අභිමුඛත්වය පමණක් සෙවිය යුතුය. අපගේ ජීවිතයේ එවැනි සටන්කාමී අවස්ථාවන් වලදී දේව පාමුල සිටීමට ඉගෙන ගත යුතුය. නමුත් බොහෝ අවස්ථාවන් වලදී ප දේව අභිමුඛත්වය යාම අමතක කර දමා අපගේ මිත්‍රයින්, පවුලේ

6 වෙනි පිටුවට....

## Special News!

1. Our convocation of **Nehemiah Bible Colleges** for the year 2022-2023, was held on 3rd June at the campus of BKN, Purasawalkam. Twenty two students (boys & girls) graduated and were sent into the field of ministry.
2. In Chepauk and Velachery, Chennai, the **Nehemiah Bible Colleges** started functioning from last 5th June in Tamil and Hindi.
3. In our Santhoshapuram campus, our **Nehemiah Bible College** started from 3rd July 2023 functioning in Tamil.
4. Our **St.Paul's Matriculation School** started functioning from 12th June for lower classes and 14th June for higher classes. New students are getting admitted in the School.

**Brethren, pray for us.** (Thessalonians 5:25)

GREAT COMMISSION PARTNERS
ECHO OF HIS CALL MINISTRIES
SINCE 1969

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

**බෙදා ගැනීම (ගලාති 6:2)**
**උපකාර කිරීම (රෝම 12:13) සහ**
**පුබුදු කිරීම (2 තිමෝති 1:6)**

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**අගෝ:19-** ජූලි 03 වනදා සිට නෙහෙමියා බයිබල් විදුහල නැවත ඉගැන්වීම් ආරම්භ කල බැවින් දෙවිඳුන්ට ස්තුති ප්‍රශංසා කරන්න

**අගෝ:20-** දේවධර්ම උපාධිය සඳහා අවශ්‍ය සෑම ඉගැන්වීම් නෙහෙමියා බයිබල් විදුහල තුළින් ආරම්භ කිරීම පිනිස දෙවිඳුන්ට ස්තුති ප්‍රශංසා කරන්න

**අගෝ:21-** නෙහෙමියා බයිබල් විදුහලේ නව විදුහල්පති තුමා ලෙස පත්වූ දේවගැති ජෝන් ස්ටැන්ලි ගැන දෙවිඳුන් ස්තුති ප්‍රශංසා කරන්න

**අගෝ:22-** භාෂා 16 කින් මුද්‍රණය වන කැඳවීමේ ප්‍රතිරාවය පුවත්පත ඉන්දීය මධ්‍ය රජය විසින් ලියාපදිංචි පුවත්පතක් ලෙස පිලිගැනීමට මගපෙන්වීම ලැබෙන පිනිස දෙවිඳුන්ට ස්තුති ප්‍රශංසා කරන්න

**අගෝ:23-** කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ සක්‍රීය සේවකයන් කැපවීමෙන් සේවය කරන මානසිකත්වයක් තුළ සිටීම පිනිස දෙවිඳුන්ට ස්තුති ප්‍රශංසා කරන්න

**අගෝ:24-** ඉන්ද්‍රජිත් රෝයි සහෝදරයා මුහුණ දී ඇති අසනීප තත්වයෙන් සනීපය ලැබෙන පිනිස ස්තුති ප්‍රශංසා කරන්න

**අගෝ:25-** සදාචාරාත්මකව සහ මූල්‍යමය ලෙසදායකත්වය ලබාදෙන සහයකයන් කැඳවීමේ ප්‍රතිරාවය සේවයට ලැබෙන පිනිස ස්තුති ප්‍රශංසා කරන්න

**අගෝ:26-** කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ 55 වන සංවත්සරයට ආශිර්වාද කල දෙවිඳුන්ට ස්තුති ප්‍රශංසා කරන්න

**අගෝ:27-** කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ තරුණ තරුණියන්ගේ සහභාගීත්වය ගැන දෙවිඳුන්ට ස්තුති ප්‍රශංසා කරන්න

**අගෝ:28-** පාස්ටර් සෑම් සෙල්වරාජ්ගේ ජීවිත කථාව සම්පූර්ණ කිරීමට අනුග්‍රහය ලැබෙන පිනිස දෙවිඳුන්ට ස්තුති ප්‍රශංසා කරන්න

**අගෝ:29-** නෙහෙමියා බයිබල් විදුහලේ අධ්‍යනය කාර්ය මණ්ඩලය සහ ඔවුන්ගේ පවුල් ගැන දෙවිඳුන්ට ස්තුති ප්‍රශංසා කරන්න

**අගෝ:30-** ශාන්ත පාවුළු මෙට්‍රිලේසන් විදුහලේ විදුහල්පතිතුමා, අධ්‍යනය කාර්‍යය මණ්ඩලය සහ ශිෂ්‍යයන් ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**අගෝ:31-** යාච්ඤා මැදිහත්කරුවන්, මහාආඥාවේ මැදිහත්කරුවන් ඇතුළු අනෙක් සේවකයන් සහ ඔවුන්ගේ පවුල් වල අයට ස්වාමීන්වහන්සේගේ කරුණාව ලැබීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**සැප්:01-** කැඳවීමේ ප්‍රතිරාවය පුවත්පත් සේවයේ සහකාර කතෘවරුන් ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**සැප්:02-** කැඳවීමේ ප්‍රතිරාවය පුවත්පත් සේවයේ විවිධ සේවා කරන අය ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**සැප්:03-** කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ සියලුම සේවකයන් ගැන ස්තුති ප්‍රශංසා කරන්න

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**සැප්:04-** පාස්ටර් සෑම් සෙල්වරාජ් ඇතුළු පවුලේ අය නපුරු දුෂ්ට බලවේග වලින් ආරක්ෂා වීම සඳහා යාච්ඤා කරන්න

**සැප්:05-** කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ සියලුම තාක්ෂනික නිලධාරින් ගැන යාච්ඤා කරන්න

**සැප්:06-** පීඩා හිරිහැර විඳිමට ලක්වී සිටින කිතුණුවන් නැවත පුනරුත්ථාපනය කිරීම ගැන යාච්ඤා කරන්න

**සැප්:07-** 2023 - 2024 අධ්‍යනය වර්ෂ සඳහා නෙහෙමියා බයිබල් විදුහලට සිසුන් ලියාපදිංචිවීම ගැන යාච්ඤා කරන්න

**සැප්:08-** නෙහෙමියා බයිබල් විදුහලේ ඉගැන්වීම් සඳහා නන් අයුරින් සේවක දායකත්වය ලබාදෙන අය ගැන යාච්ඤා කරන්න

**සැප්:09-** කිතුණු දේශකයන් ව්‍යාජධර්ම වලට සම්බන්ධ නොවී දේශනා කිරීම ගැන යාච්ඤා කරන්න

**සැප්:10-** සිරගෙවල්වලට ගොස් දේව සේවය කරන සේවකයන් ගැන යාච්ඤා කරන්න

**සැප්:11-** දෙවියන්වහන්සේගේ රාජ්‍යය මේ පොළොවේ වර්ධනය වීමේ දර්ශනය කිතුණු සෑමට ලැබෙන පිනිස යාච්ඤා කරන්න

**සැප්:12-** කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ තරුණ සේවය සහ දුරස්ථ සේවා ගැන යාච්ඤා කරන්න

**සැප්:13-** මත්ද්‍රව්‍යවලට සහ මත්පැන් වලට ඇබ්බැහි වී සිටින අය පසුතැවිලිවී ගැලවීම ලබාගන්නා පිනිස යාච්ඤා කරන්න

**සැප්:14-** සෑම කිතුණු නිකායකටම අයිති දේවස්ථානවල ආරක්ෂාව ගැන යාච්ඤා කරන්න

**සැප්:15-** කාන්තාවන් සහ දරුවන් වෙත එල්ලවන හිංසනයන් වලට විරුද්ධව යාච්ඤා කරන්න

**සැප්:16-** කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ නිර්මාතෘ පාලක සෑම් සෙල්වරාජ්ගේ ජිවිත කථාව ලිවීම ගැන යාච්ඤා කරන්න

**සැප්:17-** කිතුණු සේවය කරන සියලුම දෙනාගේ සුභසාධනය ගැන යාච්ඤා කරන්න

**සැප්:18-** පාස්ටර් සෑම් සෙල්වරාජ් ඇතුළු සියලු සභා පාලකවරුන්ට නව දර්ශනයක් ලැබෙන පිනිස යාච්ඤා කරන්න

*4 පිටුවෙන්....*

අය එසේ නොමැති නම් දේව දාසයින්ට දුරකථන ඇමතුමක් දී පිළිතුරු සොයති. නමුත් මෙය වරදක් නොවන අතර අප ප්‍රථමයෙන් කල යුත්තේ යේසුස් වහන්සේගේ පාමුලට යාමයි. මරියා යේසුස් වහන්සේ ගේ පාමුල තිබූ වැදගත්කම ඉතා හොඳින්ම දැන සිටියේය. කානානිය ස්ත්‍රිය ඇගේ දියණියගේ සුවය උදෙසා යේසුස් වහන්සේගේ පාමුල වැටුනේය. යාකෝබ් දෙවියන්වහන්සේගේ දූතයාව අල්ලාගෙන ඔබ මට ආශිර්වාද කරන තෙක් මා ඔබව අත් නොහරිමියි කියා පැවසුවේය. ඔබ මේ දේ කියවන විට දෙවියන්වහන්සේගෙන් ඔබ යම් දෙයක් බලාපොරොත්තු වෙනවා නම් පළමුකොට උන්වහන්සේගේ පාමුලට පැමිණෙන්න. මනුෂ්‍යයන්ගේ පාමුල වැටීමට වඩා දේව පාමුල වැටීම අනර්ඝයි.

''ස්වාමීනී, ඔබ මට යමක් කරන තුරු මා ඔබව අත් නොහරිමියි'' කියා ස්වාමීන්වහන්සේට පවසන්න.යෝෂුවා දෙවියන්වහන්සේ ඉදිරියෙහි වැටී සිටි මොහොතේදී දෙවියන්වහන්සේ යමක් කිරීමට පෙර උන්වහන්සේ යෝෂුවා කුමක් කල යුතුද කියා පෙන්වීය. ප්‍රිය මිත්‍රය, ඔබගේ ජීවිතයේද යමක් වෙනස් කිරීම පිණිස යාච්ඤා කිරීමට පෙර පළමුකොට ''ස්වාමීනි, ඔබවහන්සේ මගේ ජීවිතයෙහි කුමන වෙනසක් බලාපොරොත්තු වෙනවාද?'' කියා අසන්න. දෙවියන් වහන්සේ යෝෂුවාට කතාකොට පැවසුසේක.

***''නැගිටියන්න, මක්නිසාද මෙසේ මුහුණින් වැතිර ඉන්නෙහිද? ඉශ්‍රායෙල්වරු පව්කලෝය.... එබැවින් ඉශ්‍රායෙල් පුත්‍රයන්ට තමුන්ගේ සතුරන් ඉදිරියෙහි සිටින්ට බැරිය....'' (යෝෂුවා 7:10-12)***

දෙවියන්වහන්සේ යෝෂුවාට ඉතා ඍජුවම කරුණු පැවසීය. එක් මනුෂ්‍යයෙකුගේ අකීකරුකම නිසා මෙම පරාජය මුළු මහත් ජාතියටම ඇතිවූවේය කියා දෙවියන්වහන්සේ යෝෂුවාට පැහැදිලි කලේය. ප්‍රිය මිත්‍රවරුනි, දෙවියන්වහන්සේගේ දයාවත් උපකාරයත් ලැබීමට නම්, අප ස්වාමීන්වහන්සේ පවසන්නාවූ දෙයට කීකරු වීම ඉතාම වැදගත්ය. දවන පූජාවට වඩා කීකරුකම වැදගත්ය. අප මුළුමනින්ම කීකරු විය යුතුය. අප තුළ සම්පූර්ණ කීකරුකමක් නොමැතිනම් එය අකීකරුකමකි. අප කිසි දෙයක් ගැන නොසිතා කිසිදු සැකයකින් තොරව දෙවියන්වහන්සේට කීකරු විය යුතුය.

## ආකෝර් මිටියාවත

### 1. නින්දාව සහ අපකීර්තියේ සලකුණකි.

යෙරිකෝව පිළිබඳව දෙවියන්වහන්සේ දුන්නාවූ අවවාද පැහැදිලිය. ස්වාමීන්වහන්සේ මෙසේ පැවසූසේක. ***''විනාශයට කැපවූ දෙයින් කොහොමහරි වැළකියල්ලා, නැතහොත් නුඹලා කැපකල පසු කැපවූ දෙයින් යමක් ගත්තොත්, නුඹලා ඉශ්‍රායෙල් අන්දායමට ශාප ලැබෙන්ට සලස්වා එය කළඹනවා ඇත.'' (යෝෂුවා 6:18)***

නමුත් ආකාන් ඔහුගේ බැල්මට ලස්සනය කියා සිතූ සමහර දේවල් ගත්තේය. එපමනක් නොව එය ඔහු ලඟ තබාගත්තේය. දෙවියන්වහන්සේගේ බලය ආකාන් අඩු තක්සේරු කලේය. දෙවියන්වහන්සේ ආකාන්ගේ ක්‍රියාව ගැන කෝපයට පත්විය. ***''කොල්ලය අතරේ ශෝභන බබිලෝනිය සළුවක්ද රිදී ෂෙකෙල් දෙසීයයක්ද ෂෙකෙල් පනසක් බර ඇති රන් පේනුවක්ද මම දැක, ඒවාට ආශාවී, ඒවා ගත්තෙමි, ඒවා මගේ කූඩාරම මැද පොළොව යට සඟවා තිබේ. ඊට යටින් රිදී තිබේ. යයි කීවේය. (යෝෂුවා 7:21)***

ආකාන්ගේ තේරීම සහ ඔහුගේ තීරණය නිසා ඉතා දරුණු ප්‍රතිවිපාකයක් අත්විය. ඔහුගේ ක්‍රියාව නිසා එය ඔහුගේ භාර්‍යාවට හා දරුවන්ට බලවත් ප්‍රතිවිපාකයක් විඳීමට සිදුවිය. මන්ද ඔහුගේ පාපය නිසා ඔහුට මුළු ජීවිතයම දීමට සිදු විය. ඔහුගේ භාර්‍යාව හා දරුවන්ටද ගල් ගසා මරා දමනු ලැබීය. එය ඔහුට පමණක් නොව ඔහුගේ මුළු පවුලටම එය නින්දාවක් බවට පත් විය.

අප රහසිගතව කරන්නාවූ සෑම පාපයකටම අපට පිටස්තර ලෙස ප්‍රතිවිපාකයක් ඇත. ආකාන් රහසිගතව සොරකම් කර එය රහසිගතව සැඟවූ නමුත් දෙවියන්වහන්සේ එය එළියට ගත්තේය. ආකාන් සහ ඔහුගේ මුළු පවුලටම එනිසා දඬුවමක් දුන්නේය. එබැවින් ඔබ රහසිගතව කරන්නාවූ සියලු වැරදි ගැන ප්‍රවේශම් වන්න, ***''මක්නිසාද යහපත් වේවා, නපුරු වේවා, සියලු ක්‍රියාද, සියලු රහස් දේද දෙවියන්වහන්සේ විනිශ්චයට පමුණුවනසේක.'' (දේශනාකාරයා 12:14)*** අපගේ ක්‍රියාවන් නිසා අපගේ දරුවන්ට අනිසි විපාකයක් නොලැබෙන පිණිස එක් විනාඩියක් නැවතී මේ මොහොතේදීම දෙවියන්වහන්සේ සමඟ කථා කරමින් උන්වහන්සේගෙන් සමාව අයදින්න.

අපගේ ක්‍රියාව එක් පුද්ගලයෙකුගෙන් නවතින්නේ නැත. මගේ තෝරාගැනීම, මගේ තීරණය හා මගේ අකීකරුකම කරණකොටගෙන එය අපගේ මුළු පරම්පරාවට විශාල බලපෑමක් ඇතිවෙයි. නමුත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ කල්වාරි කුරුසියේ කල යාගය ගැන ස්තුති කරමි. ***''මක්නිසාද එක මනුෂ්‍යයාගේ අකීකරුකම කරණකොටගෙන බොහෝ දෙනා පව්කාරයන් කරනු ලැබූවා සේම, එක්කෙනාගේ කීකරුකම කරණකොටගෙන බොහෝ දෙනා ධර්මිෂ්ඨකරනු ලබන්නෝය.'' (රෝම 5:19)***

මා ආකාන්ගේ කථාව කියවන විටදී ඔහුගේ පවුල ගැන සිතුවෙමි. ඔහුගේ දරුවන් හා ඔහුගේ භාර්‍යාව මෙවැනි අමාරු අවස්ථාවකට මුහුණ දෙන විටදී ඔවුන් කුමන ආකාර සිතුවිල්ලක් ඇතිවෙන්නට ඇද්ද? ඔවුන් මෙම පාපයට සම්බන්ධ කියා මෙහිදී කිසිම සඳහනක් කර නොමැත. ඔවුන්

මේ පිළිබඳව දැන සිටියේද නැත. දිනක් උදැසන මුළු ජාතියම ඔබට විරුද්ධව නැගී සිට ඔබව තනිකර, ඔබට අපහාස කර, ඔබව ලැජ්ජාවට පත්කර විටදී ඔබ එයට කිසිම සම්බන්ධතාවයක් නොමැති විටදී වෙනත් කෙනෙකුගේ වරද නිසා ඔබව නින්දාවට පත් වන විටදී ඔබ කුමන අපහසුතාවයකට පත්වන්නේද? ආකාන්ගේ බිරිඳ හා දරුවන්ද මේ ආකාරයටම මහත් අමාරුවකට හා අසීරුතාවයකට පත්විය.

ඔබත් මේ සඟරාව කියවන්නාවූ මොහොතේදී ''මමත් මේ තත්වයෙන්ම සිටිනවා, තව කෙනෙකුගේ වරද නිසා මා වන්දි ගෙවනවා. මා නින්දාවට පත්ව සිටිනවා. දෙවියන්වහන්සේ මේ සම්බන්ධව කිසිවක් කරන්නේ නැත්තේ ඇයි? කියා ඔබ සිතන්නට පුළුවන.

එසේ මේ සම්බන්ධව තවත් ආකාරයකින් බැලීමට හැකිය. ආකාන් මෙම බඩු රැගෙන පොළොව හාරා වලලන විටදී ඔහුගේ පවුලේ අය මේ ගැන කිසිවක් නොකියා මේ ගැන අප කුමට කලබල වෙනවාද? කියා සිතන්නට ඇත. එසේ නොමැතිනම් මේ වරද දැක නිහඬව සිටින්නට ඇත. මෙයට නිහඬතාවයේ සම්බන්ධතාවය කියා පවසයි. දෙවියන්වහන්සේට විරුද්ධව දේවල් සිදුවන විට තව කෙනෙක් ක්‍රියා කරන විට අපට නිහඬව සිටීමට බැරිය. අප සත්‍ය උදෙසා නැගී සිටිය යුතුය.

ආකාන්ගේ පාපය නිසා ඉශ්‍රායෙල් සෙනඟ දෙවියන්වහන්සේ ඉදිරියෙහි වැරදිකාරයින් බවට පත්විය. එක් පුද්ගලයෙක් අකීකරුව ක්‍රියා කල නිසා එයට සමස්ථ ඉශ්‍රායෙලයම වගකියන්නට විය. එක් මනුෂ්‍යයෙකුගේ අපරාධ ක්‍රියාවක් නිසා දෙවියන්වහන්සේ මුළු ජාතියටම දඬුවම් දුන්නේ ඇයි? අප ලෝකයට පාපය පැමිණුනේ කෙසේද? එක් මනුෂ්‍යයෙකුගේ අකීකරුකම කරණකොටගෙන එය මුළු ලෝකයටම බලපානු ඇත. නමුත් ස්වාමීන්වහන්සේට ස්තුති වේවා, එක් මනුෂ්‍යයෙකුගේ කීකරු කම නිසා (යේසුස් ක්‍රිස්තුස්වහන්සේ) අපට ගැලවීම ලැබුණි. ආකාන්ගේ පාපය මුළු මහත් ඉශ්‍රායෙල් සමාජයටම මහත් බලපෑමක් විය.

## 2. සැඟවුන පාපයේ සලකුණ

ආකාන්ගේ අකීකරුකම ඔහුගේ පාපය සැඟවීමට හේතුවක් විය. ඔහු කල දෙය කිසිවක් දුටුවේ නැත. ඔහුගේ තණ්හාව හා ආශාව නිසා ඔහුගේ ජීවිතයට පමණක් නොව ඔහුගේ මුළු පවුලටම එය ශාපයක් විය. ගීතාවලිය 139 වන පරිච්ඡේදය සඳහන් කර ඇති පරිදි දෙවියන්වහන්සේ අපගේ සැමදේම දන්නා සේක.

''ස්වාමිනි, ඔබ මා විමසා බලා දැන ගත්සේක. ඔබ මාගේ හිඳීමද නැගිටීමද දන්නා සේක. දුරදීම මාගේ සිතුවිල්ල ඔබට තේරෙයි. ඔබ මාගේ ගමනත් සයනයත් විමසා බලනසේක. මාගේ සියලු මාර්ග දැනගෙන සිටිනසේක. මක්නිසාද, ස්වාමිනි, ඔබ මුළුමුනින්ම නොදන්නාවූ කිසි වචනයක් මාගේ දිවේ නැත්තේය.

අපගේ පාපය අප සැඟවනවා නම්, එහි ප්‍රතිවිපාකය ඉතා බරපතලය. සැඟවුන ස්ථානයන් ප්‍රසිද්ධ වෙයි. ***''මක්නිසාද මාගේ ඇස් ඔවුන්ගේ සියලු මාර්ගයන් කෙරෙහි යොමා තිබේ. ඒවා මාගේ මුහුණෙන් සැඟවී නැත. ඔවුන්ගේ අයුතුකමද මාගේ ඇස් ඉදිරියෙන් වැසී නැත.'' (යෙරෙමියා 16:17)***

දෙවියන්වහන්සේ අපගේ සැඟවුන රහස් දනී. ස්වාමීවූ දෙවියන්වහන්සේ ඉදිරියෙහි අපි අපවම විවෘතව තැබිය යුතුය. උන්වහන්සේගේ කරුණාව මහත් නිසා ආකාන්ට මෙන් උන්වහන්සේ ක්‍රියා නොකර අපට උන්වහන්සේගේ කරුණාව දැක්වීමට කැමැත්තෙන් සිටී. දෙවියන්වහන්සේ අපගේ හදවතේ ආශාව දන්නා සේක. අප කරන්නාවූ දේවල් අඳුරේ සිදුවන දේවල් නම්, දෙවියන්වහන්සේ ඒවා එළියට ගෙනෙයි. අප සිටින්නාවූ පරාජිත ස්ථානයෙහි ඇති නින්දාවෙන් හා ලැජ්ජාවෙන් එළියට එන්නට අවශ්‍යයි. අප දෙවියන්වහන්සේ ඉදිරියෙහි පවිත්‍රවිය යුතු අතර අවංක විය යුතුය. පරණ ගිවිසුමේ දවස්වලදී මෙන් නොව දැන් අපට යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ලේ කරණකොටගෙන අපව උන්වහන්සේ පවිත්‍ර කිරීමට සූදානමෙන් සිටී.

***''ආකාන් යෝෂුවාට උත්තර දෙමින්, සැබැවින් මට ඉශ්‍රායෙල්ගේ දෙවිවූ ස්වාමීන්වහන්සේට විරුද්ධව පව්කලෙමි. මම මේ මේ ආකාර කෙලෙමි. කොල්ලය අතරේ ශෝභන බබිලෝනය සළුවක්ද රිදී ෂෙකෙල් දෙසියයක්ද ෂෙකෙල් පනසක් බර ඇති රන් පේනුවක්ද මම දැන, ඒවාට ආශාවී, ඒවා ගත්තෙමි, ඒවා මාගේ කූඩාරම මැද පොළොව යට සඟවා තිබේ ඊට යටින් රිදී තිබේ යයි කීවේය. යෝෂුවා පණිවිඩකාරයන්***

Pray for NEHEMIAH BIBLE
RESIDENTIAL / EVENING COLLEGE,
Velachery / Chepauk & Santhoshapuram, Chennai.
Medium : Hindi / Tamil
Registered Candidate for Membership
Asia Theological Association (ATA)
Recognised by International Christian Leaders & Senior Pastors for the past 53 years
Certificate in Theology : One year
Diploma in Theology : Two years
Bachelor in Theology : Three years
Qualification : 10th Standard & above
Rush for admission!
Contact : The Chairman, Nehemiah Bible College.
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA.
Phone : (+91-44) 2852 8282, Cell : (+91) 98410 71852 / 95661 31858
E.mail : sam@echoofhiscall.org / Website : www.echoofhiscall.org
✶ ONLINE CLASSES ARE AVAILABLE ✶



# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

**''...කියවන්නා තේරුම් ගනීවා....''** *(මතෙව් 24:15)*

(පාස්ටර් සැම් සෙල්වරාජ්ගේ ජීවිත අත්දැකීමකි)

## BELIEVE HIM FOR MIRACLES!




''අපගේ පහත් ස්වභාවයේදී අප සිහිකල උන්වහන්සේට ස්තුති කරව්. මක්නිසාද අන්වහන්සේගේ කරුණාව සදාකල් පවත්නේය.'' (ගීතාවලිය 136:23)

බොහෝ හාස්කම්වලට ස්වාමින්වහන්සේ විශ්වාස කරන්න.

1971 වන වසරේදී මගේ සේවය ආරම්භ කල කාලයේදී චෙන්නෙයි තැපැල් කාර්යාලය ළඟට ගොස් මා හට තැපැල් පෙට්ටි අංකයක් ලබා ගැනීමට ඉල්ලුම් පත්‍රයක් ලබා ගැනීම පිණිස මා ඉල්ලුම් කලේය. එවිට 2957 අංකය දරණ තැපැල් පෙට්ටිය මා හට ලැබුණි එම කාල වකවානුව තුලදී මා හට ලිපි ලබා ගැනීමට මෙය ස්ථිර ලෙසම අවශ්‍යව තිබුණි. මන්ද මට කියා ස්ථිර ලිපිනයක් ඒවන විටත් නොතිබුණි.

ඒ දිනවලදී මා හට විශාල ආර්ථික ප්‍රශ්නයන් තිබුණි. මා හට ලැබෙන මාස්පතා වැටුපෙන් මගේ සේවය පවත්වාගෙන ගියෙමි. බොහෝ අවස්ථාවන් වලදී මුදල් නොමැති වූ නිසා කුසගින්නෙන්ද සිටීමට සිදු විය. මගේ සෑම අවශ්‍යතා, සේවය හා ජීවිතයේ සියලුම කාරණාවන් ගැන මා දෙවියන්වහන්සේව විශ්වාස කලෙමි. උන්වහන්සේ මා සමග සිට උන්වහන්සේගේ බලවත් වු හස්තය මා පිට තිබෙන බව මට නිතරම හැඟුනි.

1976 වන වර්ෂයේදී කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව මුද්‍රණය කරන්නාවූ ස්ථානයට මුදල් ගෙවීමට නොහැකි විය. ඒ සම්බන්ධව මා බොහෝ දවස් යාච්ඤා කලද දෙවියන්වහන්සේගෙන් මා හට පිලිතුරක් ලැබුනේ නැත. ඒ නිසා මගේ තැපැල් පෙට්ටි පහසුකම අවලංගු කර මා තැම්පත් කර තිබූ රුපියල් 500/- ක මුදල නැවත ලබා ගැනීමට තීරණය කර ගත්තෙමි. එනිසා මා තැපැල් කාර්යාලයට ගොස් තැපැල් පෙට්ටිය අවලංගු කර මා ගෙවූ මුදල නැවත මට ලබා දෙන්නය කියා තැපැල් ස්ථානාධිපතිතුමාට ලිපියක් දුන්නෙමි. නමුත් ඔහු තැපැල් පෙට්ටියක් ලබා ගැනීමට ඇති අසීරුතාවය පිළිබඳ පැහැදිලි කර එය කරන්න එපා කියා මා අධෛර්‍යමත් කලේය. මා බොහෝ අසරණ තත්ත්වයට පත්වුනෙමි. අවසානයේදී තැපැල් ස්ථානාධිපතිතුමා මාගේ තැපැල් පෙට්ටිය අවලංගු කර මගේ තැන්පත් මුදල මට ආපසු ලබා දුන්නේය.

මා තැපැල් ස්ථානාධිපති කාර්‍යාලයෙන් නැවත එළියට එන විටදී ගෝවින්ද නැමැති තවත් නිලධාරී මහතෙක් ඔබ මෙම තැපැල් පෙට්ටිය අවලංගු කිරීමට හේතුව කුමක්ද කියා මගෙන් ඇසීය. එවිට මා සිටින තත්ත්වයත් මට ඇති මුදල්මය ප්‍රශ්නයක් ගැන ඔහුට පැවසුවෙමි. එම මොහොතේම ඔහු මට මුදල් ලැබෙන්නට සලස්වා නැවත තැපැල් ස්ථානාධිපති ළඟට ගොස් එම තැපැල් පෙට්ටිය මා හට ලබා දුන්නේය. අදටත් එම තැපැල් පෙට්ටි අංකය අපගේ සේවය උදෙසා පාවිච්චි කරමු. ස්වාමීන්වහන්සේට සියලු ගෞරවය හා මහිමය වේවා.

මාගේ ජීවිතයෙහි තිබූ සියලු කඳු හා පල්ලම් සෑම අවස්ථාවකදීම ස්වාමීන්වහන්සේ මට විශ්වාසවන්තව සිටියේය. මගේ දිළිඳුකමේදී රෝගයේදී හා අනෙකුත් සියලුම අවස්ථාවන් වලදී මට උපකාර කරන පිණිස උන්වහන්සේගේ දූතයින්ව මා වෙත එව්වේය. උන්වහන්සේ බලවත් වූ දෙවියන්වහන්සේයි. මෙම දෙවියන්වහන්සේ ඔබගේ ජීවිතයේත් ඕනෑම අවස්ථාවකදී බලවත් හාස්කමක් කිරීමට පුළුවන. ප්‍රේමවන්තය ඔබගේ ජීවිතයේත් හාස්කමක් උදෙසා උන්වහන්සේව විශ්වාස කරන්න.

*******

***හැරියේය. ඔව්හු කූඩාරමට දිවගියෝය. බලව, එයත් එය යට රිදීත් ඔහුගේ කූඩාරමෙහි සඟවා තිබෙනවා සම්බවුණේය. ඔව්හු කූඩාරම මැද සිට ඒවා යෝෂුවා ළඟටද සියලු ඉශ්‍රායෙල් පුත්‍රයන් ළඟටද ගෙනවුත් ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි තැබූහ.'' (යෝෂුවා 7:20-23)***

කරුණාකර අප අපවම සෝදිසි කර බලමු. අපගේ ජීවිතයේ සැඟවුන පාප තිබේද? ඔබගේ කාලය ඔබ ගතකරන්නේ කෙසේද? ඔබගේ දුරකථනයෙහි ඔබ බලන්නාවූ දේවල් මොනාවද? ඔබ දෙවියන්වහන්සේට කාලය නොදී සමාජ මාධ්‍යයට ඔබ වැඩි කාලයක් දෙනවාද? ඔබගේ ප්‍රශ්නය ගැනම ඔබ කථා කරමින් සිටිනවාද? නැතිනම් ඔබ

දෙවියන්වහන්සේගේ පොරොන්දු අත්පත් කරගන්නවාද? ඔබගේ ජීවිතය අභිරහස් වලින් පිරී තිබෙනවාද? දෙවියන්වහන්සේ සමඟ හදට හදක් එක් වී කථා කල යුතු කාලය එළැඹී තිබේ. දෙවියන්වහන්සේගේ වචනය කියවීමට හා යාච්ඤා කිරීමට වැඩි කාලයක් යොමු කරන්න.

## 3. නැවුම් ආරම්භයකට හා බලාපොරොත්තුවකට සලකුණාකු

ආකෝර් මිටියාවත නින්දාව, අපකීර්තිය, පරාජය, ලැජ්ජාව සහ මරණයට සමාන කල හැකිය. නමුත් එම තත්වයෙන් අපට අලුත් බලාපොරොත්තුවක්, හා නව ආරම්භයක් ඇති කරමින් බලාපොරොත්තුවේ දොරටුවක් විවර කරගත හැකිය. හොෂෙයා 2:15 මෙය සාර්ථක වන්නේ කෙසේද?

ආකාන් සහ ඔහුගේ පවුලේ අයගේ මරණයෙන් පසු සමස්ථ ඉශ්‍රායෙල් ජාතියම පසුතැවිලිවීමෙන් දෙවියන්වහන්සේව සෙවීමට පටන්ගත්තේය. වරක් දෙවියන්වහන්සේ සමඟ පාපය ගැන ගණුදෙනු කල විටදී, උන්වහන්සේගේ දයාව කරණකොටගෙන නැවත අපව ගොඩනැගීමට පටන්ගනී. උන්වහන්සේ උන්වහන්සේගේ තරහාව දිගටම පවත්වා යන්නේ නැත. උන්වහන්සේගේ කුරුසියේ යාගය නිසා අපි උන්වහන්සේට ස්තුති වෙමු. මන්ද තවදුරටත් අපව දඬුවමට පත්නොවෙයි. අපගේ පාපය අප කියා සිටී නම්, උන්වහන්සේ අපට කමාව දී ඇත. ***''එතැන් පටන් ඇගේ මිදිවතු පැනීමේ දොරක් පිණිස ආකෝර් මිටියාවත ඇට දෙන්නෙමි. එහි ඇගේ යෞවන දවස්වලදී මෙන්ද අද මිසර දේශයේ සිට ආ කාලයේදී මෙන්ද ඇ උත්තර දෙනවා ඇත.'' (හොෂෙයා 2:15)*** මෙය අපට ආශිර්වාදයක් වෙයි.

මෙම පණිවිඩය ඔබ කියවන විටදී දැන් මගේ ජීවිතයේ මා අවසානයට පැමිණ සිටින බවත් මට හැරෙන්නට කාලයක් හෝ බලාපොරොත්තුවක් නැත කියාත් මා වටා ඇති සියලුම දේ අශුභ ලෙස සිදුවෙයි කියාත් ඔබ සිතනවා ඇත. ඔබගේ කණට ඇසෙන්නාවූ සියලුම දේ ඔබව කල කිරීමට පත්වෙන්නාවූ පණිවිඩයයි. මෙය මාගේ අවසානයයි කියා ඔබ සිතනවා විය හැකිය. මාගේ ප්‍රිය සහෝදරයා සහෝදරිය මෙය නතර කරන්න. අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මේ ලෝකයට පැමිණියේ අප උදෙසා කල නොහැකිවූ දේ කරන පිණිසයි. මලාවූ ගර්භයට ජීවනය දීමට උන්වහන්සේට පුවළුන. මැරුණාවූ පුද්ගලයෙකු මළවුන්ගෙන් නැගුටුවීමට උන්වහන්සේට පුවළුන. අන්ධවූ ඇස් විවර කිරීමට උන්වහන්සේට පුළුවන. මාර්ගයක් නොමැති වූ කල අලුත් මාර්ගයක් නොමැති වූ කල අලුත් මාර්ගයක් විවෘත කිරීමට උන්වහන්සේට පුළුවන. ඔබ මුළුමුනින්ම බලාපොරොත්තු රහිතව සිටීනම් ඔබට ඉතා යහපත් වූ පණිවිඩයක් තිබේ. ඔබ සිටින ස්ථානයෙහිදීම උන්වහන්සේ ඔබගේ හිස ඔසවනවා ඇත. ඔබව ලැජ්ජාවට පත්වෙන්නාවූ ස්ථානයෙහිදීම ස්වාමීන්වහන්සේ ඔබව මහිමයට පත්කර ඔබගේ සතුරන් ඉදිරියෙහි ඔබගේ හිස තෙලින් ආලේප කර ඔබව උසස් කරනවා ඇත. මේ දේ සිදුවීමට නම් අප යමක් කල යුතුය. අප දෙවියන්වහන්සේට අවංක විය යුතුය. අප උන්වහන්සේ අකමැතිවූ දේ අප තුල තිබේ නම් ඒවා උන්වහන්සේගේ අභිමුඛත්වය වෙත ගොස් ප්‍රකාශ කරමින් සමාව ලබාගත යුතු අත එම පව් නැවත නැවත නොකර පවිත්‍ර වූ ජීවිතයක් ගත කරමු.

දෙවියන්වහන්සේ සමඟ තිබෙන්නාවූ අපගේ සම්බන්ධතාවය ඉතා යහපත් ලෙස තබා ගැනීම අත්‍යාවශ්‍ය වෙයි. ඔබගේ ජීවිතයම උන්වහන්සේ වෙනස් කර ඔබ වෙනුවෙන් උන්වහන්සේ අලුත් පිටුවක් ලියනු ඇත. ඔබට නැති වුනාවූ සියලුම දේ උන්වහන්සේ නැවත ඔබට දෙනු ඇත. එබැවින් ස්වාමීන්වහන්සේ සමඟ ඔබගේ සම්බන්ධතාවය හරිගස්වාගන්න.

ආකෝර් මිටියාවත සැනසීමක් නැත්තාවූ වේදනාවෙන් පිරී තිබෙන ස්ථානයක්ය. එම ස්ථානයෙහිදීම ඔබ උන්වහන්සේව සොයනවා නම් එය ඔබට සැනසීමේ ස්ථානයක් ලෙස වෙනස්වනු ඇත. ***''මා සෙවුවාවූ මාගේ සෙනඟ උදෙසා ෂාරොන් එළු බැටළු රැළවලට තෘණ බිමක්ද ආකෝර් මිටියාවත ගව රැළවලට ලැඟුම්පලක්ද වන්නේය.'' (යෙසායා 65:10)***

**ප්‍රිය සහෝදරයා, සහෝදරිය ආකෝර් මිටියාවතේ සිට බලාපොරොත්තුවේ දොරටුව දක්වා ඔබගේ ගමන් මාර්ගය මෙසේය.**

- ★ ඔබ නින්දාවෙන් ගමන් කරන්නාවූ ගමනට බලාපොරොත්තුවක් ඇති වෙයි.
- ★ කැඩුණාවූ බිඳුණාවූ දේ තුළින් අලුත් දෙයක් නැවත ගොඩනගයි.
- ★ ඔබගේ අධෛර්‍යය, කල කිරීම පරාජය හා මලානිකවූ දේ තුළින් ඔබට ප්‍රීතිමත් අනාගතයක් උදා වෙයි.
- ★ අපගේ ප්‍රශ්නය දෙවියන්වහන්සේට භාරදී උන්වහන්සේ සමග අත්වැල් බැදගතහොත් ප්‍රශ්නයෙන් තොර බලාපොරොත්තු ඇති ජීවිතයක් උරුමවෙයි.
- ★ අපගේ දුක නැමැති ආකොර් මිටියාවත ප්‍රීතිමත් සාගරයක් වනු ඇත.
- ★ ඔබගේ තීරණය හරි නම් පීඩාවෙන් ඉවසීමද ඉවසීමෙන් අත්දැකීමෙන් බලාපොරොත්තුවද ඇතිවෙයි.
- ★ අපගේ සෑම අවස්ථාවකදීම උන්වහන්සේ මා සමගය කියා සිතමින් උන්වහන්සේට ඇලුම් වෙමින් මේ ගමන ගමන් කල යුතුයි.
- ★ අපට ලබන්නාවූ දඬුවම් ප්‍රීතිමත් අත්දැකීම් නොවෙයි. ඒවා අමාරු හා වේදනාකාරී වන නමුත් අප ඒ තුලින් ගමන් කල විටදී අපට ලැබෙන්නාවූ අවසාන ප්‍රතිඵලය නම් ආශිර්වාදයයි.

අද දවසේදී ඔබගේ මුළු ජීවිතයම ස්වාමින්වහන්සේගේ දෑතට භාරකරයි කියා මා යාච්ඤා කරමි. ඔබ සිතනවාටත් වඩා උන්වහන්සේ ඔබට ආශිර්වාද කිරීමට බලා සිටී. ඔබගේ ආකොර් මිටියාවත ආශිර්වාදයේ දොරටුවක් වේවා කියා ප්‍රාර්ථනා කරමි.

*******

RNI NO. TN/SIH/2006/17846

## Echo of His Call Postal Courses for candidates in India only

**Pray for** BIBLECOR

We offer Postal Course on Basic Truths of The Bible to new Christians and non-Christians in English – 57 pages, Hindi – 76 pages & Tamil – 96 pages. You will get a course book entitled **New Life – For You!** **After the completion of this course, you will get a certificate. There will be no compulsory fees. You will be blessed!**

The Chairman, Nehemiah Bible College, Echo of His Call, Post Box 2957, CHEPAUK, CHENNAI - 600 005.
Ph.: (044) 2852 8282, 2852 9293, 2854 7766, Cell : 98410 71852, 95661 31858 E.mail : biblecor@yahoo.co.in

## කැඳවීමේ ප්‍රතිරාවය

සෑම මසකම භාෂා 16 කින් නිකුත් වන සඟරාව, බයිබල් විද්‍යාලය, තැපැල් මාර්ගික බයිබල් පාඩම් මාලාව, සභා රෝපණය, පාසැල් අධ්‍යාපනික සේවය, සුභාරංචි රැස්වීම් මාලා, සම්මේලනය පැවැත්වීම ආදිය.

| | |
|---|---|
| වාර්ෂික දායකත්වය - රු. 100/- | ජීවිත දායකත්වය - රු. 2000/- |

කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ විවිධාකාර සේවාවන් අප පවත්වාගෙන යනු ලබන්නේ ඔබගේ උපකාරයන් හා ස්වේච්ඡාවෙන් ඔබ දෙන සම්මාදන් හා දීමනා කරණකොටගෙනය. ස්වාමීන්වහන්සේ ඔබට මඟපෙන්වන්නාවූ ආකාරයෙන් කැඳවීමේ ප්‍රතිරාවය සේවයට උපකාර කිරීමට ඔබටද හැකිය. ඔබ දෙන්නාවූ උපකාර කරණකොට ගෙන දෙවියන්වහන්සේව නොදන්නාවූ සෙනඟට සුභාරංචිය ප්‍රකාශ කිරීමට උපකාර වෙනවා ඇත.

ඔබට මෙම සඟරාව අවශ්‍ය නම්, කරුණාකර අපට දන්වා එවන්න. ඔබගේ ඊ-මේල් ලිපිනය හා දුරකථන අංකයද, එසේම ඔබගේ ලිපිනය වෙනස් කරනවා නම් එම වෙනස් වූ ලිපිනයද අපට දන්වා එවන්න.

අපගේ වෙබ් අඩවියට ගොස් මෙම භාෂා 16 කින් ඇති සඟරාවන් බලා ගැනීමට ඔබට හැකිවනු ඇත. ඔබගේ ලිපි, යාච්ඤා ඉල්ලීම් සහ ඔබගේ උපකාරයන් පහත ලිපිනයට අප වෙත එවන්න.

කරුණාකර ඔබගේ දුරකථන අංකය, ජංගම දුරකථන අංකය හා ලිපිනය අප වෙත එවන්න.

**ECHO OF HIS CALL**
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA
PH: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98412 71858, 98410 71852
E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in
Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.com

**Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846**
**Date of Publication: First week of every month**
**Date of Posting : 1st & 2nd of every month**
**Posted at "Egmore RMS / 1 Patrika Channel"**
on 2nd AUGUST 2023.
**If un-delivered please return to:**
**ECHO OF HIS CALL (SINHALA)**
**P.O. Box No. 2957,**
**Chepauk, Chennai - 600 005, INDIA.**
**Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766**

***JESUS LOVES YOU!***

To

*GOD BLESS YOU!*

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by **S. Sam Selva Raj** at **Echo of His Call Printers,** New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**